06 ශ්‍රේණිය - විද්‍යාව

වැඩ පොත

(මතුගම අධ්‍යාපන කලාපය)

(සියලුම ඒකක ආවරණය වන ලෙස සැකසූ ඒකක පරීක්ෂණ ප්‍රශ්න පත්‍ර 11 කින් සමන්විතය)

හසිත හෙට්ටිආරච්චි

(Dip. In Sci. N.I.E./O.U.S.L.)

මතුගම අධ්‍යාපන කලාපය

විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

6 ශ්‍රේණිය	ජෛව ලෝකයේ ආශ්චර්යය	ඒකකය - 01

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

(01). වරහන් තුළ දී ඇති වචනවලින් ගැළපෙන පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

i. හරිත ශාක ..... ජීවීන් වේ. (ස්වයංපෝෂී/විෂමපෝෂී)

ii. ජීවිත කාලය තුළම වර්ධනය වීම ..... සතු ලක්ෂණයකි. (ශාක/සතුන්)

iii. ..... සර්ව භක්ෂක සතෙකි. (සමනළයා/කපුටා)

iv. ..... තුළ පමණක් අඩංගු කොළ පැහැති වර්ණකය හරිතප්‍රද වේ. (ශාක/සතුන්)

v. ජීවීන් තම ආහාර අවශ්‍යතා සපුරා ගැනීමේ ක්‍රියාවලිය ..... නම් වේ. (පෝෂණය/වර්ධනය)

vi. ශාක ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලියේ දී ..... වායුව පිට කරයි. (ඔක්සිජන්/නයිට්‍රජන්)

vii. පියවි ඇසට නොපෙනෙන ජීවීන් ..... ලෙස හැඳින්වේ. (ක්ෂුද්‍ර ජීවීන්/මාංශ භක්ෂකයින්)

viii. වයසින් වැඩෙන්ම ජීවීන් ප්‍රමාණයෙන් විශාල වීම ..... නම් වේ. (ප්‍රජනනය/වර්ධනය)

ix. ..... පියවි ඇසට නොපෙනෙන ක්ෂුද්‍ර ජීවීන් නිරීක්ෂණයට යොදා ගනී. (අන්වීක්ෂය/දුරේක්ෂය)

x. ..... ශාක පත්‍ර අතින් ඇල්ලූ විට හැකිළේ. (නිදිකුම්බා/කතුරු මුරංගා)

(ලකුණු 10)

(02). A කොටසේ දී ඇති අදහස පැහැදිලි කිරීමට ගැළපෙන පිළිතුර B තීරුවෙන් තෝරා යා කරන්න.

	A	B
i.	ශාක පමණක් ආහාරයට ගනී.	කාබන්ඩයොක්සයිඩ්
ii.	හරිතප්‍රද සහිත ශාකවල පමණක් සිදු වේ.	බැක්ටීරියා
iii.	අවර්ණ හුණු දියර කිරි පැහැයට හරවයි.	මහා රාවණා රැවුල
iv.	ජීවීන්ගේ අඛණ්ඩ පැවැත්මට අවශ්‍ය වේ.	ශාක භක්ෂකයන්
v.	සිරුර තුළ ශක්තිය නිපදවීමේ ක්‍රියාවලියයි.	සමනළයා
vi.	සංචරණය කළ නොහැකි චලන දක්වන සතෙකි.	දෙබෙදුම් සුචි
vii.	ජීවීන් වර්ග කිරීමට යොදා ගනී.	ප්‍රභාසංශ්ලේෂණය
viii.	යුෂ උරා බොන සත්වයෙකි.	මුහුදු මල
ix.	වෙරළබඩ ශාකයකි.	ශ්වසනය
x.	ක්ෂුද්‍ර ජීවී කාණ්ඩයකි.	ප්‍රජනනය

(ලකුණු 10)

(03). පහත දැක්වෙන ජීවීන් අතුරින් ක්ෂුද්‍ර ජීවීන් රවුම් කරන්න.

අඹ ගස	මකුළුවා	පටිපනුවා
බැක්ටීරියා	දිලීර	පැරමීසියම්
ගවයා	කටුස්සා	සමනළයා
ඇමීබා	වෛරස්	අන්වීක්ෂීය පනුවන්

(ලකුණු 05)

(04). පහත ප්‍රකාශන නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

i. ශාකවල ශ්වසන චලන නිරීක්ෂණය කළ නොහැක. ( )

ii. මාළුවා සංචරණය සඳහා කරමල් යොදා ගනී. ( )

iii. ගිරවා විකා ගිලින සත්ත්වයෙකි. ( )

iv. ශාකවල ආහාර නිපදවීමට අවශ්‍ය ශක්තිය සපයන්නේ සූර්යයා ය. ( )

v. සර්ව භක්ෂකයන් සෘජුවම හෝ වක්‍රව ශාක මත යැපේ. ( )

vi. කූඩළු ශාකය පැළැටියකට උදාහරණයකි. ( )

vii. ප්‍රභාසංශ්ලේෂණය ශාකවලට පමණක් පොදු ලක්ෂණයකි. ( )

viii. පියාසර කිරීමට නොහැකි පක්ෂීන් ද ඇත. ( )

ix. සෑම සත්වයකුටම සංචරණය කළ හැක. ( )

x. ගොඩබිම ජීවත් වන සතුන් භෞමික සතුන් නම් වේ. ( ) (ලකුණු 10)

(05). දෙබෙදුම් සුචියක් මගින් පහත සතුන් වෙන් කර දක්වන්න.



(ලකුණු 15)

මතුගම අධ්‍යාපන කලාපය

විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

6 ශ්‍රේණිය	අප අවට ඇති දේ	ඒකකය - 02

- **නිවැරදි පිලිතුර යටින් ඉරක් අඳින්න**

1. ඝන පදාර්ථය සඳහා උදාහරණ පමණක් අඩංගු පිළිතුර වන්නේ,

   a. යකඩ ඇණ, පෑන, පොල් තෙල් b. ජලය, අයිස්, පොත

   c. හිම, වැලි, අයිස් d. පෙට්ට්‍රල්, ඩිසල්, භූමිතෙල්

2. ස්කන්ධයක් සහිත දේ අඩංගු පිළිතුර වන්නේ,

   a. ආලෝකය b. ඔක්සිජන් වායුව c. තාපය d. ශබ්දය

3. අවකාශයේ ඉඩක් නොගන්නා දේ අඩංගු පිළිතුර වන්නේ,

   a. පෑන b. පොත c. ශක්තිය d. විදුරුව

4. ස්කන්ධයක් ඇති සහ අවකාශයේ ඉඩක් ගන්නා දේවල් හැඳින්වෙන නම වන්නේ,

   a. තාපය b. ආලෝකය c. පොත d. පදාර්ථය

5. හිරුඑළිය ශක්ති ආකාරයක් ලෙස හැඳින්වෙන්නේ,

   a. ස්කන්ධයක් ඇති නිසා b. ඉඩක් ගන්නා නිසා

   c. ස්කන්ධයක් හෝ ඉඩක් නොගන්නා නිසා d. ඉඩක් නොගන්නා නමුත් ස්කන්ධයක් ඇති නිසා

6. වායු පදාර්ථ පමණක් අඩංගු පිළිතුර වන්නේ,

   a. ජලය,ජලවාෂ්ප b. හිරුඑළිය,ජලවාෂ්ප c. ජලවාෂ්ප,ඔක්සිජන් d. ඔක්සිජන් ,යකඩ

7. නිශ්චිත පරිමාවක් ඇති නමුත් නිශ්චිත හැඩයක් නොමැති ද්‍රව්‍ය අඩංගු පිළිතුර වන්නේ,

   a. අල්මාරිය b. ගිණිපෙට්ටිය c. පොල්කිරි d. පිඟාන

8. භංගුරතාව පෙන්වන ද්‍රව්‍යක් වන්නේ,

   a. යකඩ ඇණය b. විදුරුව c. පොත d. රබර්

9. සිනිදු වයනයක් ඇති ද්‍රව්‍යක් නොවන්නේ,

   a. වැලි කඩදාසි b. පුයර c. කොස්ලෙලි d. කළුගල්

10. රත්රන් භාණ්ඩ සෑදීමට හැකිවන්නේ රත්රන් සතු කවර ගුණාංගයක් නිසාද?

    a. භංගුරතාව b. තන්‍ය බව c. ප්‍රත්‍යස්ථ බව d. සිනිදු බව (ලකුණු 10)

රචනා ප්‍රශ්න

1. (A) පහත වාක්‍ය හරි නම් ✓ලකුණ ද වැරදි නම් × ලකුණ ද කොටුව තුළ යොදන්න'

වාතය අවකාශයේ ඉඩක් ලබා ගනී.	
මේසය ඝන පදාර්ථයකි.	
ශබ්දය ශක්ති ආකාරයක් නොවේ.	
හිස් බැලුම් බෝලයකට හුළං පිරවූ විට ස්කන්ධය වැඩි වේ.	
ජලයට නිශ්චිත හැඩයක් ඇත.	

(B) හිස්තැනට සුදුසු වචන තෝරා සම්පූර්ණ කරන්න.

අප අවට පරිසරයේ අඩංගු දේවල් .....සහ ශක්ති ලෙස බෙදා දැක්විය හැක. අවකාශයේ ඉඩක් ගන්නා සහ .....ඇති දේ පදාර්ථ ලෙස හැඳින්වේ. පදාර්ථය ඝන,ද්‍රව, ... ලෙස අවස්ථා තුනකට බෙදිය හැක. ඝන පදාර්ථ වලට නිශ්චිත හැඩයක් හා නිශ්චිත ..... ඇත. ද්‍රව පදාර්ථ වලට නිශ්චිත හැඩයක් නැති අතර නිශ්චිත පරිමාවක් ..... . වායු පදාර්ථ වලට නිශ්චිත හැඩයක් හා නිශ්චිත පරිමාවක් නැත.

(වායු / ඇත / පදාර්ථ / ස්කන්ධයක් / පරිමාවක්) (ලකුණු 10)

2. ඔබ පාසලේදි සිදුකල ක්‍රියාකාරකම් දෙකකට අදාළ රූප සටහන් a හා b ලෙස පහත දැක්වේ.

(a)



(b)



i. ඉහත a හා b ඇටවුම් යොදාගනිමින් නිරීක්ෂණය කළ හැක්කේ කවර පදාර්ථයක් සතු ලක්ෂණ පිලිබඳවද?

ii. ඉහත ඇටවුමේ එක් බැලූනයක නුල කැපුව හොත් මීටර් කෝදුවේ සමබරතාවයට කුමක් සිදුවේද?

iii. ඝන ද්‍රව වායු යන පදාර්ථ තුනටම පොදු ලක්ෂණයක් සඳහන් කරන්න.

iv. ද්‍රව සහ වායු යන පදාර්ථ දෙකටම පොදු ලක්ෂණයක් සඳහන් කරන්න.

v. ද්‍රව පදාර්ථය සතු වායු පදාර්ථයට නොමැති ලක්ෂණය කුමක්ද?

vi. විදුරු කැපීමට දියමන්ති භාවිතා කරන්නේ දියමන්ති සතු කවර ගුණාංගයක් නිසාද?

vii. රේඩියෝවෙන් නිකුත් වන ශක්ති ආකාරය කුමක්ද?

viii. නිවසේ බහුලව භාවිතා වන ශක්ති ආකාරයක් නම් කරන්න. (ලකුණු 08)

3. (a) පහත සඳහන් ද්‍රව්‍ය ඝන ද්‍රව වායු ලෙස වගුව තුල දක්වන්න.

(පොල් තෙල්, ගල්කැටය, පෑන, ජලවාෂ්ප, පුළුන්, ඔක්සිජන්, රත්‍රන්, අගුරු, වතුර, සහල්)

ඝන	ද්‍රව	වායු

(b) පරිසරයේ ඇති ශක්ති ආකාර තුනක් ලියන්න.

(c) ස්කන්ධය මැනීමට භාවිතා කල හැකි ඒකක දෙකක් නම් කරන්න. (ලකුණු 15)

4. (a) වාතය අවකාශයේ ඉඩක්ගන්නා බව පෙන්වීමට සිදුකල හැකි ක්‍රියාකාරකමක රූපසටහනක් ඇඳ නම් කරන්න.

(b) පුයර අතින් ඇල්ලූ විට සිනිදු බවක්ද වැලි රළු බවක්ද දැනෙයි මෙම ගුණාංගය හඳුන්වන නම ලියන්න.

(c) භංගුරතාව පෙන්වන ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.

(d) රබර් වල ඇදෙන සුළු බව හඳුන්වන නම කුමක්ද?

(e) තන්‍යතාව යනු කම්බි සතු ගුණාංගයකි. තන්‍යතාව යන්නෙහි තේරුම කුමක්ද?

(f) ආඝන්‍යතාව පෙන්වන ද්‍රව්‍ය දෙකක් නම් කරන්න' (ලකුණු 07)

මතුගම අධ්‍යාපන කලාපය

විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

6 ශ්‍රේණිය	ජලය ස්වභාවික සම්පතක් ලෙස	ඒකකය - 03

- වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

(1). ජලයේ ඝන, ද්‍රව හා වායු යන භෞතික අවස්ථා පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
1. ජල වාෂ්ප, ද්‍රව ජලය හා අයිස් 2. අයිස්, ද්‍රව ජලය හා ජල වාෂ්ප
3. ද්‍රව ජලය, අයිස් හා ජල වාෂ්ප 4. ද්‍රව ජලය, ජල වාෂ්ප හා අයිස්

(2). භූගත ජලය රැස්වී ඇති ස්ථානයක් ලෙස සැලකිය හැක්කේ,
1. සාගරය 2. පොකුණු 3. ළිං 4. වැව්

(3). පෘථිවි පෘෂ්ඨයේ ඇති ජලයෙන් අපට පරිභෝජනය කළ හැකි ජල ප්‍රතිශතය වන්නේ,
1. 0.01% 2. 70% 3. 97.41% 4. 10%

(4). කරදිය අඩංගු ජලාශ වන්නේ,
1. සාගර හා මුහුදු 2. කලපු හා බොකු 3. ළිං හා පොකුණු 4. ගංගා හා ඇළ දොළ

(5). පහත සඳහන් වගන්ති අතුරින් ජලය පිළිබඳ සත්‍ය ප්‍රකාශය තෝරන්න.
1. ලවණතාවය පදනම් කර ගෙන ජලය අයිස්, ද්‍රව ජලය සහ හුමාලය ලෙස වර්ග කර ඇත.
2. වර්ෂණය, මතුපිට ජලය සහ භූගත ජලය යනු ජලය පවතින විවිධ ආකාර වේ.
3. පෘථිවි පෘෂ්ඨයේ පවතින ජලයෙන් 70%ක් පමණ ප්‍රයෝජනයට ගතහැකි ජලය වේ.
4. ග්ලැසියර් යනු ජලය වාෂ්ප ලෙස පවතින ආකාරයකි.

(6). ශාකයකට ජලය ප්‍රයෝජනවත් වන අවස්ථාවක් වන්නේ,
1. ශාකයට ඛනිජ ලවණ උරා ගැනීමට 3. ශාකය ඍජුව පවත්වා ගැනීමට
3. ශාක පත්‍රවල ආහාර නිෂ්පාදනයට 4. ඉහත සඳහන් කාර්යයන් සියල්ලටම

(7). ජල දූෂණය ලෙස හැඳින්වෙන්නේ,
1. ජලාශවල ජල මට්ටම ඉහළ යාම 2. ජලාශවල ජලජ ජීවීන් වර්ධනය වීම
3. ජලාශවල ගැඹුර අඩුවීම 4. ජලය ජීවීන්ගේ පරිභෝජනයට නුසුදුසු තත්වයට පත්වීම

(8). ලවණ ප්‍රමාණය වැඩිවන අනුපිළිවෙලට ජලය පෙලගස්වා ඇති නිවැරදි පිලිතුර තෝරන්න.
1. කරදිය, මිරිදිය, කිවුල්දිය 2. මිරිදිය, කිවුල්දිය, කරදිය
3. කරදිය, කිවුල්දිය, මිරිදිය 4. කිවුල්දිය, කරදිය, මිරිදිය

(9). කලපුවල අඩංගු ජලය හඳුන්වන්නේ කුමන නමින්ද?
1. කරදිය 2. මිරිදිය 3. කිවුල්දිය 4. බොරදිය

(10). පහත සඳහන් ඒවායින් අසත්‍ය වගන්තිය තෝරන්න.
1. ජල දූෂණය අවම කිරීමට කඩිනම් පියවර ගත යුතුය.
2. මතුපිට ජලය දූෂණය වීම භූගත ජලය දූෂණය වීමට හේතු නොවේ.
3. ජල දූෂණය හේතුකොට ගෙන පරිභෝජනයට ගත හැකි ජල ප්‍රමාණය සීමිත වී ඇත.
4. ජල දූෂණය අවම කර, ජල සම්පත රැක ගැනීම අප සැමගේ යුතුකමකි. (ලකුණු 10)

B කොටස - රචනා

01. පහත ප්‍රකාශ වලින් නිවැරදි ප්‍රකාශය සඳහා (√) ලකුණ ද වැරදි ප්‍රකාශය සඳහා (×) ලකුණ ද යොදන්න.
i. ජලය ඝන, ද්‍රව හා වායු යන භෞතික අවස්ථා තුනෙන්ම පවතී. ( )
ii. කලපුවල ජලය කරදිය ලෙස හැඳින්වේ. ( )
iii. ලුණු ලේවා තුළදී මුහුදු ජලය වාෂ්පීභවනය කර ලුණු නිපදවාගනු ලැබේ. ( )
iv. ජීවී දේහ තුල බහිස්ස්‍රාවී මාධ්‍යයක් ලෙස ජලය වැදගත් වේ. ( )
v. ශාකවල පැවැත්මට ජලය අත්‍යවශ්‍ය නොවේ. ( )
vi. ජල දූෂණය නිසා පරිභෝජනයට ගතහැකි ජලය ප්‍රමාණය අඩුවී ඇත. ( )
vii. ශාකවල පැවැත්මට ජලය අත්‍යවශ්‍ය නොවේ. ( )
viii. ලවණතාවය වැඩි වන විට ජලයේ ඝනත්වය ද වැඩි වේ. ( )
ix. පෘථිවි පෘෂ්ඨයේ ඇති ජලයෙන් 97%ක් මිරිදිය අඩංගු වේ. ( )
x. ප්‍රවාහන කටයුතු සඳහා ජලය භාවිතා කල හැකිය. ( )
(ලකුණු 10)

02. හිස් තැනට සුදුසු වචනය වරහන තුලින් තෝරා ලියන්න.

(දූෂණය, කිවුල්දිය, විජලනය, ද්‍රව, ග්ලැසියර්, සීමිත, ලවණ, හුමාලය, උල්පත්වලින්, භූගත)

i. අප බොහෝවිට ජලය ලෙස ව්‍යවහාර කරනු ලබන්නේ ..... අවස්ථාවේ පවතින ජලයටයි.

ii. ධ්‍රැවාසන්න ප්‍රදේශවල ..... ලෙස පවතින්නේ ඝන අවස්ථාවේ ඇති ජලයයි.

iii. ජල වාෂ්ප සහ ..... වායු අවස්ථාවේ පවතින ජලය සඳහා උදාහරණ වේ.

iv. පස තුල ඇති වැලි බොරලු, ගල් ආදිය අතර රැඳී ඇති ජලය ..... ජලය ලෙස හැඳින්වේ.

v. ළිංවලින් හා ..... අපට ලැබෙන්නේ භූගත ජලයයි.

vi. කලපුවල අඩංගු ජලය ..... ලෙස හැඳින්වේ.

vii. මිරිදියෙහි දියවී ඇති ..... ප්‍රමාණය ඉතා ස්වල්පයකි.

viii. ශරීරයෙන් අධික ලෙස ජලය ඉවත්වීමෙන් ශරීරය ..... වී මරණයට වුවද පත්විය හැකිය.

ix. ජලය ..... සම්පතකි.

x. මිනිසාගේ අදූරදර්ශී ක්‍රියා හේතුවෙන් සීමිත සම්පතක් වන ජලය ..... වෙමින් පවතී.

(ලකුණු 10)

03. සොබා දහමෙන් අපට දායාද කළ ප්‍රයෝජනවත් දෑ ස්වාභාවික සම්පත් ලෙස හැඳින්වේ. ජලය සීමිත ස්වාභාවික සම්පතකි.



ඉහත රූපයේ දක්වා ඇත්තේ පෘථිවි පෘෂ්ඨයේ ඇති ජල ප්‍රමාණයන්ය.

i. රූපයේ දැක්වෙන පරිදි වැඩිපුරම ජලය ඇත්තේ කොහිද?

ii. ජලය පවතින ප්‍රධාන ආකාර 3ක් ඔබ ඉගෙන ගෙන ඇත. ඒවා නම් කරන්න.

iii. ජලයේ විවිධ ප්‍රයෝජන 4ක් ලියා දක්වන්න.

iv. මිනිස් ක්‍රියාකාරකම් නිසා ජලය දූෂණය වනු ඇත.ජලය දූෂණය වන ක්‍රම 2ක් ලියන්න.

v. ජල දූෂණය යනු කුමක්ද?

vi. ඒවා අවම කර ගැනීමට යෙදිය හැකි උපක්‍රමයක් ඉදිරිපත් කරන්න.

vii. දූෂිත ජලය පානය කිරීමෙන් වැළදිය හැකි රෝග 2ක් නම් කරන්න (ලකුණු 10)

04. පෘථිවි පෘෂ්ඨයෙන් 70%කට වැඩිය ජලයෙන් යට වී පවතී. නමුත් පරිභෝජනයට ගත හැකි ජලය ඉතා සුළු ප්‍රමාණයක් පවතී.

i. ජලය සීමිත සම්පතක් වන්නේ ඇයි දැයි කෙටියෙන් සඳහන් කරන්න.

ii. සෘජුව පරිභෝජනයට ගත නොහැකි ආකාරයේ ජලය සහිත ජල ප්‍රභව දෙකක් නම් කරන්න.

iii. ජලයේ විවිධ ප්‍රයෝජන 4ක් ලියා දක්වන්න.

iv. ජීවීන්ට ජීවය පවත්වා ගැනීම සඳහා ජලය ප්‍රයෝජනවත් වන අවස්ථා 4ක් ලියන්න.

v. නිවසේදී හා පාසලේදී ජලය අපතේ යා හැකි අවස්ථා 2ක් ලියා දක්වන්න.

vi. ඔබට කරදිය, මිරිදය සහ කිවුල් දිය වෙන වෙනම සපයා ඇති නම් ඒවා වෙන් කර හඳුනා ගැනීමට සුදුසු ක්‍රමයක් යෝජනා කරන්න. (ලකුණු 10)

මතුගම අධ්‍යාපන කලාපය

විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

6 ශ්‍රේණිය | **එදිනෙදා ජීවිතයේ දී ශක්තිය** | **ඒකකය - 04**

✦ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01) මිනිසාට ශක්තිය ලබාදෙන මූලික ප්‍රභවය වන්නේ,
1) සුළඟ 2) න්‍යෂ්ටික ශක්තිය 3) සූර්යයා 4) ජලය

02) ශක්තිය යනු,
1) බලයයි 2) කාර්යයයි 3) චලනය කිරීමයි 4) කාර්ය කිරීමේ හැකියාවයි

03) පහත ඒවා අතරින් ශක්ති ප්‍රභවයක් නොවන්නේ,
1) ජෛව ස්කන්ධ 2) උෂ්ණත්වය 3) ඉන්ධන 4) ෆොසිල ඉන්ධන

04) දහනයේ දී තාපය ලබා දෙන්නේ පහත සඳහන් කුමන ශක්ති ප්‍රභවය ද?
1) සූර්යයා 2) ඉන්ධන 3) සුළඟ 4) විදුලිය

05) අප භාවිතා කරන ප්‍රධාන ජෛව ස්කන්ධ වන්නේ,
1) සුළඟ 2) සූර්ය තාපය 3) දර 4) ලී කුඩු

06) චන්ද්‍රයාගේ හා සූර්යයාගේ බලපෑම නිසා සාගරයේ ජල මට්ටම වරින් වර වෙනස් වේ. මෙම එක් එක් අවස්ථාවලදී,
1) විදුලිය නිපදවිය හැකිය. 2) භූ තාපය නිපැදවිය හැකිය.
3) ජීව වායුව නිපදවිය හැකිය. 4) න්‍යෂ්ටික බලය නිපදවිය හැකිය.

07) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති සුළං විදුලි බලාගාර 02 ක් වන්නේ,
1) පුත්තලම හා යාපනය 2) ගාල්ල හා මාතර
3) පුත්තලම හා හම්බන්තොට 4) හම්බන්තොට හා ගාල්ල

08) ගල් අඟුරු, පෙට්‍රෝලියම් තෙල් වර්ග, පෙට්‍රෝලියම් වායු ආදී සියල්ල ම,
1) ජෛව ඉන්ධන වේ. 2) න්‍යෂ්ටික ඉන්ධන වේ.
3) ජෛව ස්කන්ධ වේ. 4) ෆොසිල ඉන්ධන වේ.

09) පරිසර දූෂණය වැඩියෙන්ම සිදුවන්නේ පහත සඳහන් කුමන ක්‍රමයට විදුලිය නිපදවා ගැනීමේ දී ද?
1) ඉන්ධන දහනයෙන් 2) සූර්ය ශක්තියෙන්
3) සුළඟේ ශක්තියෙන් 4) ගලායන ජලයේ ශක්තියෙන්

10) නිවැරදි පිළිතුර තෝරන්න.
1) ජනගහනය වැඩි වන විට ශක්ති ප්‍රභව වැඩි වේ.
2) ශක්ති ප්‍රභව අපරිමිතව භාවිතා කළ යුතු නැත.
3) සූර්ය ශක්තිය අවසාන වෙමින් පවතී.
4) ශක්ති පරිභෝජනය අඩු කිරීම තුළින් අනාගත පරපුරට ශක්තිය ඉතිරි කර ගත හැක. (ල. 10)

B කොටස - රචනා

✦ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01) ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියක් යටතේ ප්‍රදීප්ගේ නිවසට විදුලිය ලැබී ඇත. නිවසට ආලෝකය ලබා ගැනීමට භූමිතෙල් භාවිත කළ ඔවුහු දැන් විදුලිය භාවිතා කරති. එහෙත් ආහාර පිළියෙල කර ගැනීමට අවශ්‍ය තාපය ලබා ගැනීමට තවමත් යොදා ගන්නේ දරය.

i. ඉහත ඡේදයේ සඳහන් කරුණු අනුව

අ) ශක්ති වර්ග 02 ක් නම් කරන්න. (ල. 02)

....

ආ) ශක්ති ප්‍රභව 02 ක් නම් කරන්න. (ල. 02)

....

ii. විදුලිය නිපදවීමට යොදා ගත හැකි ශක්ති ප්‍රභව 02 ක් නම් කරන්න. (ල. 02)

....

iii. අප රටේ පිහිටි ජල විදුලි බලාගාරයක් නම් කරන්න. (ල. 02)

.....

iv. අතීතයේ දී ජලයේ අඩංගු ශක්තිය යොදා ගත් අවස්ථා 02 ක් සඳහන් කරන්න. (ල. 02)

.....

.....

(02) i. ෆොසිල ඉන්ධන යනු මොනවාද?

.....

..... (ල. 02)

ii. ඔබ දන්නා ෆොසිල ඉන්ධන 04 ක් නම් කරන්න.

....

.... (ල. 02)

iii. බොහෝ ශක්ති ප්‍රභවවල මූලික ප්‍රභවය වන්නේ කුමක් ද?

..... (ල. 02)

iv. ඉන්ධන භාවිතා කර විදුලිය නිපදවනවාට වඩා සුළඟේ ශක්තිය මඟින් විදුලිය නිපදවීම වාසිදායක වන්නේ ඇයි?

..... (ල. 02)

v. ෆොසිල ඉන්ධන සෑදෙන්නේ කෙසේද?

..... (ල. 02)

(03) පහත දක්වෙන අවස්ථාවල දී භාවිතා කරන ශක්ති ප්‍රභවය කුමක්දැයි ඉදිරියෙන් ලියන්න.

ශක්තිය ලබා ගැනීමට භාවිතා කරන අවස්ථාව	**ශක්ති ප්‍රභවය**
i) කුඩු ලිප දැල්වීම.	.....
ii) වැන් රථය ගමන් කිරීම.	.....
iii) ජල විදුලි බලාගාරයක විදුලිය නිපදවීම.	.....
iv) ධාන්‍ය වේලා ගැනීම.	.....
v) වී වල ඇති බොල් වී ඉවත් කිරීම.	.....
vi) සාගර ජල මට්ටමේ වෙනස අනුව විදුලිය නිපදවීම.	.....
vii) පොළොව යට ඇති තාපය මඟින් විදුලිය ලබා ගැනීම.	.....
viii) පරමාණුවලින් ශක්තිය ලබාගෙන විදුලිය නිපදවීම.	.....
ix) ආහාර පිසීම.	.....
x) ජලය රත් කිරීම.	.....

(ල. 10)

04) එදිනෙදා ජීවිතයේ දී සිදු කරනු ලබන සෑම කාර්යයක් සඳහාම ශක්තිය අවශ්‍ය වේ.

i) ශක්තිය යනු කුමක්ද?

..... (ල. 02)

ii) සුළං පෙත්ත කරකැවීමේ දී එයට ශක්තිය ලැබුණේ කෙසේ ද?

..... (ල. 02)

iii) අතීතයේ දී සුළඟේ ශක්තිය යොදා ගත් අවස්ථා 02 ක් සඳහන් කරන්න.

..... (ල. 02)

iv) ඔබට ජල ටර්බයිනයක් සෑදීමේ දී පෙති සඳහා යොදා ගත හැකි ද්‍රව්‍යයක් ලියන්න.

..... (ල. 02)

v) ශිෂ්‍යයෙක් විසින් සාදන ලද මෙවැනි ජල රෝදයක් මතින් ජලය පහළට ගලා ගියද ජල රෝදය කැරකුනේ නැත. මෙයට හේතු වී යැයි ඔබ සිතන කරුණක් ලියන්න.

..... (ල. 02)

මතුගම අධ්‍යාපන කලාපය

විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

6 ශ්‍රේණිය | **ආලෝකය හා පෙනීම** | **ඒකකය - 05**

01. පහත දී ඇති ප්‍රකාශ හරිනම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) වැරදි ලකුණ ද යොදන්න.

i. ආලෝකය, පෙනීම සඳහා අවශ්‍ය වන ප්‍රධාන සාධකයකි. ( )

ii. චන්ද්‍රයා අලෝක ප්‍රභවයක් නොවේ ( )

iii. දැල්වූ ලාම්පුව දීප්ත වස්තුවක් ලෙස හැඳින්විය හැක ( )

iv. ආලෝකය සරල රේඛීය මාර්ගයක ගමන් කරයි ( )

v. කාඩ්බෝඩ්, ලෝහ ආදිය පාරාන්ධ ද්‍රව්‍ය වේ ( )

vi. හරිත ශාක ආහාර නිෂ්පාදනය සඳහා ආලෝක ශක්තිය භාවිතා නොකරයි ( )

vii. දීප්ත වස්තු තමා විසින්ම ආලෝකය නිපදවයි ( )

viii. ග්‍රහලෝක දීප්ත වස්තු වේ ( )

ix. සන්නිවේදන කටයුතු වලදී ආලෝකය ප්‍රයෝජනවත් වේ ( )

x. සියලුම ජීවීන් ඍජුවම හෝ වක්‍රව හරිත ශාක මත යැපේ ( )

(ලකුණු 1×10=10)

02. i. පෙනීම සඳහා අවශ්‍යවන ප්‍රධාන සාධක දෙක නම් කරන්න. (ල 02)

.....

ii. ආලෝකය නිපදවන ප්‍රධාන ප්‍රභවය කුමක්ද ? (ල 02)

.....

iii. සූර්යයා හැරුණු විට දැකගත හැකි ස්වභාවික දීප්ත වස්තු දෙකක් නම් කරන්න. (ල 02)

.....

iv. චන්ද්‍රයා අදීප්ත වස්තුවක් ලෙස සැලකීමට හේතුව කුමක්ද ? ල 04)

.....

(ලකුණු 10)

03. i. පාරදෘෂ්‍ය ද්‍රව්‍ය යනු මොනවාද ? ල 02)

.....

ii. පාරදෘෂ්‍ය ද්‍රව්‍ය සඳහා උදාහරණ දෙකක් ලියන්න. ල 02)

.....

iii. මීදුම සහිත උදෑසනක පාර පැහැදිලිව නොපෙනේ මීට හේතුව කුමක්ද ? (ල 02)

.....

iv. ආලෝක කිරණයක් හා ආලෝක කදම්බයක් ඇඳ නම්කරන්න (ල 04)

(ලකුණු 10)

04. i. ආලෝකයේ ප්‍රයෝජන හතරක් **ලියන්න.** (ල 04)

.....

.....

.....

.....

ii. සන්නිවේදන කටයුතු සඳහා අලෝකය භාවිත කරන අවස්ථා වලට උදාහරණ දෙකක් ලියන්න. **(**ල 04)

.....

.....

iii. මිනිසා නිපදවා ඇති කෘතිම ආලෝක ප්‍රභව දෙකක් නම් කරන්න. (ල 02)

.....

.....

(ලකුණු 10)

05. i. වෛද්‍ය විද්‍යාවේදී ශරීර අභ්‍යන්තරය නිරීක්ෂණය කරන උපකරණයේ නම කුමක්ද ? ල 01)

.....

ii. වෛද්‍ය ක්ෂේත්‍රයේදී ආලෝකය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා මොනවාද ? (ල 02)

.....

.....

iii. මාර්ග සංඥා සඳහා යොදා ගන්නා වර්ණ තුන නම් කරන්න. (ල 03)

.....

.....

iv. නිවසේදී විදුලි ආලෝකය අරපිරිමැස්මෙන් භාවිතයට ගත හැකි පියවර දෙකක් ලියන්න.

(ල 04)

.....

.....

(ලකුණු 10)

මතුගම අධ්‍යාපන කලාපය

විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

6 ශ්‍රේණිය	ශබ්දය හා ඇසීම	ඒකකය - 06

01. **ගැලපෙන ලෙස යාකරන්න.**

i.	හඬ නිපදවන විට සිදුවන ඔබ මොඹ චලනය	කන
ii.	ධ්වනිය නිපදවන වස්තු	පාසල් සීනු හඬ
iii.	ශබ්දය සඳහා සංවේදී වන ඉන්ද්‍රිය	ගිටාරය
iv.	ස්වාභාවිකව ඇතිවන ශබ්දයකි.	රබාන
v.	කෘත්‍රිමව ඇතිකරන ශබ්දයකි.	කම්පනය
vi.	රිද්මයකට අනුව ගැයෙන හෝ වැයෙන ශබ්ද	ධ්වනි ප්‍රභව
vii.	තන්තු කම්පනයෙන් ශබ්දය නිපදවයි.	සංගීතය
viii.	පටල කම්පනයෙන් ශබ්දය නිපදවයි.	සෙක්සෆෝනය
ix.	අවිධිමත් ශබ්ද	කුරුලු නාද
x.	වාත කඳක් කම්පනය වන උපකරණයකි.	ඝෝෂා

(ල. 10)

02. පහත සඳහන් ක්‍රියාකාරකම අනුව අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



i. ඊතල මගින් පෙන්වා ඇති කොටස් නම් කරන්න. (ල. 02)

ii. මෙම ක්‍රියාකාරකම කිරීමේ දී දක්නට ලැබෙන නිරීක්ෂණයක් ලියන්න. (ල. 02)

iii. මෙහි දී කම්පනය වන්නේ රබානේ කුමන කොටස ද? (ල. 02)

iv. ධ්වනි ප්‍රභව 02 ක් ලියන්න. (ල. 04)

03. ඔබ පංති කාමරයේදී ශබ්දය උපදවන භාණ්ඩ කිහිපයක් නිර්මාණය කරන්නට ඇත. එයින්,

i. එක් භාණ්ඩයක් වන ටින් වීණාව නිර්මාණය කිරීම සඳහා ඔබට අවශ්‍ය දෑ ලියන්න. (ල. 04)

ii. ඔබ නිර්මාණය කළ ටින් වීණාවේ නම් කළ රූප සටහනක් අඳින්න. (ල. 06)

iii. ඔබ දන්නා වාද්‍ය භාණ්ඩ අතුරින් ටින් වීණාවට සමාන වාද්‍ය භාණ්ඩයක නම ලියන්න. (ල. 02)

iv. මෙහිදී කම්පනය වන්නේ වාත කඳක් ද? පටලයක් ද? තන්තු ද? (ල. 02)

04. පහත ශබ්ද සංගීත සහ සෝෂා අනුව වර්ග කරන්න.

වයලින් වාදනය, බටනලා වාදනය, නගරයක රථවාහන ශබ්ද, කර්මාන්ත ශාලාවක ශබ්ද,
වෙළෙඳුන්ගේ කෑ ගසන ශබ්ද, තබලා වාදනය (ල. 06)

සංගීත	සෝෂා

05. ගැලපෙන රූප යා කරන්න.









(ල. 10)

The National e-learning Portal for The General Education

මතුගම අධ්‍යාපන කලාපය

විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

6 ශ්‍රේණිය	චුම්බක	ඒකකය - 07

- **වඩාත් ගැලපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(1). චුම්බකයකට ආකර්ෂණය වන ද්‍රව්‍යයක් වන්නේ,

1. පිත්තල ඇණ 2. පැන්සල් කුර 3. යකඩ ඇණ 4. තඹ කැබලි

(2). චුම්බක භාවිතා කරන උපකරණයකි.

1. මාලිමාව 2. පෑන 3. පැන්සල 4. පිහිය

(3). නිවැරදිව ධ්‍රැව නම් කරන ලද චුම්බකය වන්නේ,

1. 

2.

3.

4.

(4). දණ්ඩ චුම්බකයක චුම්බක ගුණ පිහිටීම පිළිබඳ සත්‍ය වන්නේ,

1. චුම්බක ධ්‍රැව දෙක අසල 3. N ධ්‍රැවය අසල පමණි
2. S ධ්‍රැවය අසල පමණි 4. චුම්බකය මැදට වන්නටය

(5). නිදහසේ එල්ලේන ලද චුම්බකයක් සෑම විටම,

1. ඊසාන නිරිත දිග දිශාවට පිහිටයි 3. උතුර දකුණු දිශා ඔස්සේ පිහිටයි
2. වයඹ ගිනිකොන දිශාවට පිහිටයි 4. නැගෙනහිර බටහිර දිශාවට පිහිටයි

(6). චුම්භක දෙකක් එකිනෙකට ලංකරන අවස්ථාවක පහත රූපයේ දැක්වේ. චුම්භක ආකර්ශනය වන්නේ කුමන අවස්ථාවේදී ද?

a.

b.

c.

1. a පමණි 2. b පමණි 3. c පමණි 4. ඉහත සියල්ලම

(7). මෙම රූපයේ දක්වා ඇත්තේ,



1. U චුම්බකයකි. 2. බුපර චුම්බකයකි.
3. දණ්ඩ චුම්බකයකි. 4. වලයාකාර චුම්බකයකි

(8). චුම්බකයක් වටා යකඩ කුඩුවල පිහිටීම නිවැරදිව දැක්වෙන්නේ,

1. 
2.
3. 
4.

(9). චුම්බකයන් පිළිබඳ පහත ප්‍රකාශ සලකා බලන්න.

a) විජාතීය ධ්‍රැව ආකර්ෂණය වේ. b) සජාතීය ධ්‍රැව විකර්ෂණය වේ.

c) චුම්බකයක ධ්‍රැව 02ක් පවතී.

1. a හා b සත්‍ය වේ. 3. c පමණක් සත්‍ය වේ.
2. b පමණක් සත්‍ය වේ. 4. සියල්ලම සත්‍ය වේ.

(10). වැඩිම ප්‍රභලතාවය ඇති චුම්බකය වන්නේ,

1  2  3  4 

(ල. 1x10)

B කොටස - රචනා

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

(චුම්බක ධ්‍රැව, දක්ෂිණ ධ්‍රැව, චුම්බක ක්ෂේත්‍රය, උතුරු දකුණු දිශා, ආකර්ශනය)

i. චුම්බකයක ආකර්ශන බලය වැඩිපුර ඇති ප්‍රදේශ ..... ලෙස හැඳින්වේ.

ii. ඇතැම් ද්‍රව්‍ය චුම්බක වෙත ..... වන අතර සමහර ඒවා එසේ නොවේ.

iii. චුම්බකයක් වටා එහි බලය පැතිරී පවතින ප්‍රදේශය ..... නම් වේ.

iv. නිදහසේ චලනය වන්නට ඉඩහරින ලද චුම්බකයක් සෑම විටම ..... ඔස්සේ නිශ්චල වේ.

v. චුම්බකයක S අකුරින් දක්වා ඇත්තේ ..... යි. (ල. 2x5)

02. i. පහත චුම්බක ධ්‍රැව ළං කරන විට සිදුවන්නේ ආකර්ශනයක් ද? විකර්ශනයක් ද? යන්න දක්වන්න.

a. S-S b. S-N c. N-N d. N-S (ල. 04)

ii. චුම්බකවලට ආකර්ශනය වනද්‍රව්‍ය 2ක් ලියා දක්වන්න. (ල. 02)

iii. චුම්බක භාවිතයෙන් තනා ඇති උපකරණ 2ක් නම් කරන්න. (ල. 02)

iv. චුම්බකවලට ආකර්ශනය නොවන ද්‍රව්‍ය 2ක් නම් කරන්න. (ල. 02)

03. i. හැඩය අනුව චුම්බක වර්ග කිහිපයකි. ඔබ විද්‍යාගාරයේදී නිරීක්ෂණය කර ඇති චුම්බක වර්ග 2ක් ඇද නම් කරන්න. (ල. 02)

ii. රූප සටහනේ ආකාරයට දණ්ඩ චුම්බකයක් නිදහසේ එල්ලා ඇත. එය සෑම විටම උතුරු හා දකුණු දිශා ඔස්සේ පිහිටයි.



a. චුම්බකයේ A හා B ධ්‍රැව නම් කරන්න. (ල. 02)

b. මෙම ගුණාංගය යොදාගෙන නිර්මාණය කර ඇති උපකරණය කුමක් ද? (ල. 02)

c. එම උපකරණය මඟින් ලබා ගන්නා ප්‍රයෝජනය කුමක්ද (ල. 02)

d. එම උපකරණය බහුලව භාවිතාකරන අවස්ථා 2ක් ලියා දක්වන්න. (ල. 02)

04. i. පහත සඳහන් ද්‍රව්‍ය ඔබට සපයා ඇත.

(පෙති චුම්බකයක්, යකඩ දණ්ඩ, ලී කැබැල්ලක්, කඩදාසි, කාසියක්, ඉදිකටුවක්, ඇලුමිනියම් කැබැල්ලක්, තඹ කම්බියක්, පිත්තල ඇණ)

a) චුම්බකවලට ආකර්ෂණය වන ද්‍රව්‍ය ඉහත ලැයිස්තුවෙන් තෝරා ලියන්න. (ල. 02)

b) චුම්බක වලට ආකර්ෂණය නොවන ද්‍රව්‍ය ඉහත ලැයිස්තුවෙන් තෝරන්න. (ල. 04)

ii. දණ්ඩ චුම්බකයක් වටා යකඩ කුඩු පිහිටන ආකාරය රූප සටහනකින් දක්වන්න. (ල. 02)

iii. විද්‍යාගාරයේ දණ්ඩ චුම්බක ගබඩා කර තබා ඇති ආකාරය රූප සටහනකින් දක්වන්න. (ල. 02)

මතුගම අධ්‍යාපන කලාපය

විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

6 ශ්‍රේණිය	සුවපහසු දිවියක් සඳහා විදුලිය	ඒකකය - 08

- **පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

01. විදුලිය ශක්ති ප්‍රභවයක් නොවේ. ( )
02. ඉතා කුඩා විදුලි ධාරාවක් මැනීමට ගැල්වනෝමීටරය යොදා ගනී. ( )
03. මිනිරන් විද්‍යුත් සන්නායකයකි. ( )
04. සූර්යකෝෂ වල විදුලිය උත්පාදනය සඳහා රසායනික ද්‍රව්‍ය යොදා ගනී. ( )
05. ඩයෝඩයක් තුළින් විදුලිය ගමන් කරනුයේ එක් දිශාවකට පමණි. ( )
06. විදුලිය ලබාදුන් විට ආලෝකය නිපදවන උපකරණයකි.
    1) ප්‍රතිරෝධකය 2) ආලෝක විමෝචක ඩයෝඩය
    3) ඩයෝඩය 4) ආලෝක සංවේදී ප්‍රතිරෝධකය
07. පහත සඳහන් ඒවායෙන් විද්‍යුත් සන්නායකයක් නොවන්නේ,
    1) මිනිරන් 2) තඹ
    3) යකඩ ඇණය 4) පොලිතීන්
08. සරල කෝෂයක් නිර්මාණයට අවශ්‍ය ද්‍රව්‍යයකි.
    1) වියළි කෝෂයක් 2) කොපර් තහඩුවක්
    3) ඇමීටරයක් 4) ගැල්වනෝමීටරයක්
09. ශ්‍රී ලංකාවේ තාප විදුලි බලාගාරයක් පිහිටි ස්ථානයකි.
    1) නොරොච්චෝලය 2) ලක්ෂපාන
    3) කුකුළේ ගඟ 4) කොත්මලේ
10. විදුලි අනතුරු වළක්වා ගැනීමට හේතු වනුයේ,
    1) විදුලි ස්තිරික්කයකින් රෙදි මදින විට පාවහන් පැලඳ සිටීම.
    2) අකුණු සහිත අවස්ථාවලදී රූපවාහිනී ඇන්ටනා ගලවා ඉවත් කිරීම.
    3) විදුලි රැහැන් අසල ඇන්ටනා ආදිය සවි කිරීමෙන් වැලකීම.
    4) ඉහත සඳහන් සියල්ලම.

B කොටස - රචනා

01. 6 ශ්‍රේණියේ සිසුන්ට විදුලි පරිපථයක් නිර්මාණය සඳහා ලබා දී ඇති උපකරණ පහත දැක්වේ.
    - වියළි කෝෂයක්
    - බල්බයක්
    - ගැල්වනෝමීටරයක්
    - ස්විචයක්

    1) ඉහත උපකරණ වල සංකේත ඇඳ පෙන්වන්න. (ල.4)
    2) ඉහත උපකරණ වලින් විදුලි ධාරාව මනිනු ලබන උපකරණය කුමක්ද? (ල.1)
    3) විද්‍යුත් සන්නායක ද්‍රව්‍යයක් සහ විද්‍යුත් පරිවාරක ද්‍රව්‍යයක් නම් කරන්න. (ල.2)
    4) ශ්‍රී ලංකාවේ සුළං විදුලි බලාගාරයක් පිහිටි ස්ථානයක් නම් කරන්න. (ල.1)
    5) විදුලිය සංරක්ෂණයට ඔබට කල හැකි ක්‍රියා 02 ක් ලියන්න. (ල.2)

02. පහත රූපයේ දැක්වෙනුයේ ගැල්වනෝමීටරයකට සවිකල තඹ කම්බි දඟරයක් තුළින් දණ්ඩ චුම්බකයක් චලනය කර විදුලිය නිපදවිය හැකි බව ආදර්ශනයට සැකසූ ඇටවුමකි.



1) පහත අවස්ථා වලදී ගැල්වනෝමීටරයේ පාඨාංක කටුවේ දැකිය හැකි නිරීක්ෂණ ලියන්න.
චුම්බකය කම්බි දඟරය තුලට ඇතුළු කරන විට (ල.1)
දඟරය තුල චුම්බකය නිශ්චලව ඇති විට (ල.1)
චුම්බකය දඟරය තුලින් ඉවතට ගන්නා විට (ල.1)

2) ඉහත ක්‍රමය උපයෝගී කරගෙන විදුලිය නිපදවන උපකරණ (අවස්ථා) 02 ක් නම් කරන්න. (ල.2)

3) කුඩා ජල විදුලි බලාගාරයක් ආදර්ශනය කර පෙන්වීමට අපේක්ෂා කල සිසුවෙක් ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය කට්ටලයක් රැස් කළේ ය. එහි පහත ද්‍රව්‍ය තිබුණි.
- කුඩා මෝටරයක්
- යෝගට් හැඳි
- වයර්

මෙහි තිබිය යුතු තවත් ද්‍රව්‍ය 02 ක් නම් කරන්න. (ල.2)

4) පහත උපකරණ මඟින් ඉටුකරන කාර්යයක් බැගින් ලියන්න. (ල.2)
- ඇමීටරය
- ස්විචය
- බල්බය

03. සිසුවෙක් තම නිවසේ විදුලි බිල සඳහා වැයවන මුදල් ඉතිරි කර ගැනීමට සිතුවේය. ඒ සඳහා ඔහුට උපකාරී වන ක්‍රියා කිහිපයක් යෝජනා කළේ ය.

1) ඒ සඳහා නිවසේ පාවිච්චියට උචිත විදුලි බල්බ වර්ගයක් නම් කරන්න. (ල.2)
2) විදුලිය ආරක්ෂා කිරීමට ගුවන් විදුලි හා රූපවාහිනී යන්ත්‍ර පරිහරණයේ දී අනුගමනය කල යුතු ක්‍රියා මාර්ගයක් ලියන්න. (ල.2)
3) විදුලිය ආරක්ෂා කිරීමට ශීතකරණ පරිහරණය කිරීමේ දී අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ගයක් නම් කරන්න. (ල.2)

B කොටස

විදුලියෙන් සිදුවන අනතුරු වැලැක්වීම සඳහා පහත අවස්ථාවලදී අනුගමනය කලහැකි ක්‍රියාවක් බැගින් ලියන්න.

1) විදුලි පරිපථයක් අළුත්වැඩියා කිරීමේ දී (ල.2)
2) විදුලි ස්තිරික්කයකින් රෙදි මැදීමේ දී (ල.2)

04. පහත අවස්ථා වලදී විදුලිය උත්පාදනයට යොදා ගන්නා ද්‍රව්‍ය තෝරා ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

හිරු එළිය, ගල් අඟුරු, ගලායන ජලය, රසායනික ද්‍රව්‍ය, සුළං බලය

1) සූර්ය කෝෂයෙන් විදුලිය නිපදීමේ දී (.....)
2) නොරොච්චෝලයේ තාප විදුලි බලාගාරයේ (.....)
3) වියලි කෝෂය (.....)
4) කුකුළේ ගඟ ජල විදුලි බලාගාරයේ (.....)
5) සුළං විදුලි බලාගාරවල (.....) (ල.1 බැගින්)

B කොටස

පහත උපකරණ වල ක්‍රියාව නිවැරදිව තෝරා යා කරන්න.

1) ඩයෝඩය	විදුලි ධාරාව මැනීම
2) වියලි කෝෂ	ආලෝකය ලබා ගැනීම
3) ප්‍රතිරෝධක	විදුලි ධාරාව එක් දිශාවකට පමණක් යැවීම
4) LED බල්බ	විදුලිය ලබා ගැනීම
5) ඇමීටරය	විදුලි ධාරාව පාලනය කිරීම

(ල.1 බැගින්)

මතුගම අධ්‍යාපන කලාපය

විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

6 ශ්‍රේණිය | **තාපය හා එහි බලපෑම** | **ඒකකය - 09**

(01) උෂ්ණත්වය මනින සම්මත ඒකකය කුමක් ද?

1) ෆැරන්හයිට් 2) කෙල්වින් 3) සෙල්සියස් 4) ජූල්

(02) අපගේ ප්‍රධාන තාප ප්‍රභවය වන්නේ,

1) සූර්යයා ය. 2) විදුලිය ය. 3) චන්ද්‍රයා ය. 4) දර ළිප් ය.

(03) මිනිස් සිරුරේ උෂ්ණත්වය කොපමණද?

1) $100\ ^0C$ 2) $78\ ^0C$ 3) $43\ ^0C$ 4) 37^0C

(04) වතුර කේතලයක වතුර නටන විට පිටාර ගැලීමට හේතුව වන්නේ,

1) ප්‍රසාරණයයි. 2) සංකෝචනයයි.

3) අවස්ථා විපර්යාසයයි. 4) ඝනීභවනයයි.

(05) අයිස් ජලය බවට පත් වීමෙ දී සිදුවන අවස්ථා විපර්යාසය නිවැරදිව දක්වා ඇත්තේ කුමන පිළිතුරේ ද?

1) ද්‍රව ⟶ වායු 2) ඝන ⟶ ද්‍රව

3) ඝන ⟶ වායු 4) ද්‍රව ⟶ ඝන

(06) තාපය යනු,

1) පදාර්ථයකි. 2) ශක්ති විශේෂයකි.

3) අවස්ථා විපර්යාසයකි. 4) පදාර්ථය ශක්තිය බවට පත් වන අවස්ථාවකි.

(07) තාප ප්‍රභව පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

1) පෙට්‍රල්, දර, දහයියා 2) දර, L.P වායුව, සබන්

3) ප්ලාස්ටික්, පෙට්‍රල්, වීදුරු 4) කඩදාසි , ජීව වායුව, යකඩ

(08) තාපය උපදවන විදුලි උපකරණයක් නොවන්නේ,

1) රයිස් කුකරය. 2) හීටරය 3) විදුලි උදුනය. 4) විදුලි බුබුළය.

(09) බාහිර පරිසරයේ උෂ්ණත්වය අනුව සිරුරේ උෂ්ණත්වය වෙනස් නොවන සත්ත්වයෙකි.

1) ගෙම්බා 2) නයා 3) මුවා 4) කැරපොත්තා

(10) ස්වයංක්‍රිය තාප පාලකයක් නොමැති විදුලි උපකරණය කුමක්ද?

1) හීටරය 2) විදුලි උදුන 3) රයිස් කුකරය 4) විදුලි ස්ත්‍රික්කය

B කොටස - රචනා

(01) වරහන තුළ ඇති වචන අතරින් නිවැරදි වචනය තෝරා හිස්තැන් පුරවන්න.

1) අපගේ ප්‍රධාන තාප ප්‍රභවය (සුළඟ / සූර්යයා) වේ.

2) වස්තුවක ඇති උණුසුමේ ප්‍රමාණය ..... (තාපය/උෂ්ණත්වය)

3) කේතලයේ කෙමියෙන් පිටවෙන්නේ ..... (ජලය / ජලවාෂ්ප) ය.

4) ජලයේ තාපය ඉවත්වීම නිසා ..... (අයිස්/හුමාලය) සෑදීමට ඉඩ තිබේ.

5) සාගර ජලයේ උෂ්ණත්වය වෙනස්වීම හේතුවෙන් ..... (දියවැල්/සුනාමි) ඇති වේ.

6) යකඩ තදින් රත් කරන විට පළමුව ..... (රතු/සුදු) පැහැයට හැරෙයි.

7) ද්‍රව්‍ය සිසිල් වන විට ..... (ප්‍රසාරණය/සංකෝචනය) වේ.

8) (ප්ලාස්ටික්/තඹ පතුර) ..... තුළින් තාපය හොඳින් ගමන් කරයි.

9) විදුලියෙන් තාපය උපදවන උපකරණයක් වන්නේ .....
(ගෑස් කුකරය/තාපන දඟරය)

10) උෂ්ණත්වමානය තුළ ඇති ද්‍රව්‍ය රිදි පාටය. මෙම ද්‍රව්‍ය (මධ්‍ය සාර/රසදිය) වේ. (ලකුණු 10)

(02) නිවැරදි ප්‍රකාශ ඉදිරියෙන් (√) ලකුණ ද වැරදි ප්‍රකාශය ඉදිරියෙන් (x) ලකුණ ද යොදන්න.

1) ඉන්ධන දහනයෙන් තාපය ලබාගත හැක. ( )
2) ලුණු නිපදවනු ලබන්නේ මුහුදු ජලයෙනි. ( )
3) අවස්ථා විපර්යාසය ඇතිවන්නේ තාපය නිසාය. ( )
4) රසදිය ලෝහය කාමර උෂ්ණත්වයක දී ද්‍රව්‍යයකි. ( )
5) උෂ්ණත්වමානයක රසදිය කඳ උණුසුම වැඩි වන විට පහළ බසී. ( )
6) ජල චක්‍රය ක්‍රියාත්මක වීම කෙරෙහි තාපය බලපායි. ( )
7) සිසිල් දියවැල් ගලා යන්නේ සමකය දෙසටයි. ( )
8) බාහිර පරිසරයේ උෂ්ණත්වය අනුව ගෙම්බාගේ ශරීර උෂ්ණත්වය වෙනස් නොවේ.
9) උෂ්ණත්වය මනින සම්මන ඒකකය වන්නේ කෙල්වින්ය. ( )
10) පෘථිවි උෂ්ණත්වය ඉහළ යන විට ධ්‍රැව ප්‍රදේශවල පවතින අයිස් ජලය බවට පත්වේ. ( ) (ලකුණු 10)

(03) A හා B ගැළපෙන ලෙස යා කරන්න.

A	B
1) තාප ප්‍රභවය	ඔක්සිජන් වායුව
2) ඉන්ධන	තාපය
3) දහන පෝෂණය	උෂ්ණත්වය
4) තාපය නිසා ඇතිවන විපර්යාස	බන්සන් දාහනය
5) දැල්ලෙන් බීකරයට ලැබෙන ශක්තිය	රසදිය මාවකය මට්ටමේ
6) දැල්ලෙන් ලැබෙන ශක්තියෙන් ජලයෙහි වෙනස්වන ලක්ෂණය	සෙල්සියස් අංශක
7) උෂ්ණත්වය මනින උපකරණය	අවස්ථා විපර්යාසය
8) උෂ්ණත්වය මැනීමේ දී ඇස තැබිය යුත්තේ	100 ^{0}C
9) උෂ්ණත්වය මැනීමේ ඒකකය	උෂ්ණත්වමානය
10) නටන ජලයේ උෂ්ණත්වය	මාවකය

(ලකුණු 10)

(04) (A) පහත සඳහන් අවස්ථා වලදී තාපය උරා ගනීද, තාපය පිටවේ ද යන්න සඳහන් කරන්න.

1) දර දහනය
2) විදුලි බුබුළක් දැල්වෙන විට
3) බටර් දිය වීම
4) ජලය අයිස් බවට පත්වීම
5) උණුසුම් තේ කෝප්පයක් නිවෙන විට (ලකුණු 05)

(B) කෙටි පිළිතුරු සපයන්න.

1) තාපය ප්‍රයෝජනයට ගත හැකි අවස්ථා 02 ක් ලියන්න.
2) රේල් පීලි සවි කිරීමේ දී ඒවා අතර කුඩා හිඩැසක් තැබීමට හේතුව කුමක්ද?
3) ඉඩෝර කාලයේ දී පරිසරයේ දැකිය හැකි වෙනස්කම් 02 ක් ලියන්න. (ලකුණු 05)

විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

6 ශ්‍රේණිය	ආහාර හා බැඳුණු අන්තර් ක්‍රියා	ඒකකය - 10

A -කොටස

(1) ආහාර සඳහා ජීවීන් අතර පවතින විවිධ දිශාවන්ට යොමු වූ සම්බන්ධතා නිරූපණය කරන සටහන් කුමන නමකින් හඳුන්වයි ද?

1. ආහාර ජාල 2. ප්‍රහේලිකාව 3. මෙනුපත 4. ආහාර දාමය

(2) මේ අතරින් ආහාර දාමයේ ඉහලින්ම සිටින ජීවියා කවිද?

1. තණකොළ 2. ගවයා 3. පොල්කිච්චා 4. දළඹුවා

(3) සත්වයන් හෝ සත්ත්ව ද්‍රව්‍ය පමණක් ආහාරයට ගන්නා සතුන් හඳුන්වන නාමය,

1. ඒක භක්ෂක 2. සර්ව භක්ෂක 3. ශාක භක්ෂක 4. මාංෂ භක්ෂක

(4) ආහාර දාමයක නිෂ්පාදකයා අයත් වන්නේ,

1. පළමුවන පුරුක 2. දෙවන පුරුක 3. තෙවන පුරුක 4. සිව්වන පුරුක

(5) ශාක ආහාර නිෂ්පාදනයේ දී භාවිත නොකරන්නේ,

1. ඔක්සිජන් 2. කාබන්ඩයොක්සයිඩ් 3. ජලය 4. සූර්ය ශක්තිය

(6) ආහාර ජාලයක වැදගත්කම,

1. පරිසරයේ තුලිතතාව රැක ගැනීම 2. ආහාර වර්ග හඳුනා ගැනීම
3. සතුන් සංඛ්‍යාව දැක්වීම 4. ප්‍රභාසංස්ලේෂණයට අවශ්‍ය සාධක දැන ගැනීම

(7) ශාකය → තණකොළපෙත්තා → කටුස්සා → ☐

ඉහත ආහාර දාමයේ හිස්තැනට අදාල නිවැරදිම ප්‍රකාශය තෝරන්න.

1. අනිවාර්යයෙන් ම ශාක භක්ෂකයෙකි. 2. අනිවාර්යයෙන් ම මාංශ භක්ෂකයෙකි.
3. අනිවාර්යයෙන් ම සර්ව භක්ෂකයෙකි. 4. ඉහත කිසිවක් නිවැරදි නොවේ.

(8) ශාක තුල ආහාර නිපදවීමේ **ක්‍රියාවලිය** හඳුන්වන නම කුමක් ද?

1. ප්‍රභාසංස්ලේෂණය 2. ස්වසනය 3. ඔක්සිජන් නිපදවීම 4. ආහාර ජීර්ණය

(9) නිවැරදි ආහාර දාමය තෝරන්න.

1. ගැරඩියා ⟶ ගෙම්බා ⟶ තණකොළ පෙත්තා ⟶ තණකොළ
2. දළඹුවා ⟶ පොල්කිච්චා ⟶ බළලා
3. තණකොළ ⟶ කටුස්සා ⟶ ගැරඩියා
4. පේර ⟶ ශාකය ⟶ දළඹුවා ⟶ ඇටිකුකුළා

(10) ශාක හෝ ශාක කොටස් පමණක් ආහරයට ගන්නා සතුන් හඳුන්වන නම කුමක් ද?

1. ශාක භක්ෂක 2. මාංශ භක්ෂක 3. සර්ව භක්ෂක 4. ජීවී භක්ෂක

(11) සතුන් අතරින් මාංශ භක්ෂකයෙකු නොවන්නේ,

1. කටුස්සා 2. ගැරඩියා 3. කොටියා 4. සමනලයා

(12) පහත සතුන් අතරින් ආහර දාමයක ඉහළම පුරුක විය නොහැක්කේ,

1. තණකොළපෙත්තා 2. කටුස්සා 3. ගැරඬියා 4. ගෙම්බා

(13) පහත වාක්‍ය අතුරෙන් අසත්‍ය වාක්‍ය තෝරන්න.

1. ශාක භක්ෂකයින් තණකොළ ආහාරයට නොගනී.
2. ආහාර දාමයක් ආරම්භ වන්නේ ශාකයකිනි.
3. ශාකවල අඩංගු සූර්ය ශක්තිය ශාක භක්ෂකයින් සතු ය.
4. මාංශ භක්ෂකයින් ශාක භක්ෂකයින්ව ආහාරයට ගනී.

(14) සර්ව භක්ෂක යන පදයේ තේරුම,

1. මාංෂ පමණක් ආහාරයට ගැනීමයි. 2. ශාක පමණක් ආහාරයට ගැනීමයි.
3. ශාක හා මාංෂ දෙවර්ගයම ගැනීමයි. 4. ජීවියාව සම්පූර්ණයෙන් ම ආහාරයට ගැනීමයි.

(15) අපේ නිවස තුළ වාසය කරන මාංශ භක්ෂකයෙකි.

1. කිඹුල් හූනා 2. කැරපොත්තා 3. කුහුඹුවා 4. කොස්ඇටමීයා

(16) ගොදුර යනු,

1. ශාකයකි 2. ශාක භක්ෂකයෙකි 3. සතුරෙකි 4. ආහාරයකි

(17) වස බෙහෙත් ගසා තණකොළ මැරීමෙන් අපට ලැබෙන වාසිය වන්නේ,

1. ජීවත්වීමේ ආයුෂ වැඩිවීම 2. එළිපෙහෙලි වීමෙන් තාවකාලික ලාභයක් ලැබීම.
3. අපගේ මිතුරු ජීවීන් මියයාම. 4. පළා වර්ග පරිසරයේ වැඩිවීම.

(18) පළතුරු ආදී ශාක සිටුවීමෙන් වඩාත්ම සිදු වන්නේ,

1. පළතුරු මැස්සන් වැඩි වේ. 2. ශාක භක්ෂකයින් ගෙවත්ත පැමිණේ.
3. පරිසර මිතුරෙකු බවට පත් වේ. 4. ස්වසන වායුව අඩු වේ.

(19) මිනිසා සර්ව භක්ෂකයෙකු ලෙස සැලකෙන්නේ,

1. විවිධ වර්ගයේ දත් තිබෙන නිසා ය. 2. වවාගෙන කන නිසා ය.
3. බත් ආහාරයට ගන්නා නිසා ය. 4. උයාගෙන කන නිසා ය.

(20) සියලුම ජීවීන්ට ආහාර අවශ්‍යය වන්නේ,

1.සංචරනය සඳහා ය. 2. විවිධ කාර්යයන් සඳහා ශක්තිය අවශ්‍ය බැවිනි.
3. වර්ධනය සඳහා ය. 4. ස්වසනය සඳහා ය.

(ලකුණු 20)

B කොටස - රචනා

01. A දක්වා ඇති ආහාරජාලය ඇසුරින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



1- මෙහි ඇති නිෂ්පාදක ජීවියා _____ වේ.

2- _____ ශක්තිය මගින් ආහාර සකස්කර ගැනීම ශාක සතු විශේෂ කාර්යයකි.

3-මෙම ආහාර ජාලයේ මාංශ භක්ෂක ජීවීන් ගණන _____ කි.

4-මෙහි ඇති පිටිමකුණා ට _____ මගින් සිනිමය ආහාරයක් ලබා දේ.

5-ගැරඬියා ආහාර ජාලයේ _____ ම පුරුකේ දක්වා ඇත.

B ගැලපෙන ලෙසට යා කරන්න.

A	B
• සර්ව භක්ෂකයෙකි	පණ රැක ගැනීමට ය
• බළල් පවුලට අයත් මාංශ භක්ෂකයෙකි	ශාක ආහාරයකි
• මී පැණි	බල්ලා
• ගවයා	කොළ දිවියා
• කටුස්සා පාට වෙනස් කරන්නේ	ශාක භක්ෂකයෙකි

(ලකුණු 10)

02. 1- ආහාර ජාල හා ආහාර දාම දැක්විය හැකි ආකාර 2ක් ලියන්න.

2- එහි ඉහලින්ම සිටිය යුතු ජීවියෙකු නම් කරන්න.

3- ශාක භක්ෂකයෙකු දැක්විය යුතු පුරුක දක්වන්න.

4- ගෙම්බාට ගොදුරු වන ශාක භක්ෂකයින් දෙදෙනෙකු නම් කරන්න.

5- එම ශාක භක්ෂකයින් ආහාරයට ගන්නා ස්වයංපෝෂින් දෙදෙනෙකු නම් කරන්න.

6- සෑම ජීවියෙකුම අපගේ ජීවිතයට වැදගත් වන බව පැහැදිලි වේ.සර්පයින් විනාශ කිරීමෙන් පරිසරට සිදු වන හානි 2ක් ලියන්න.

7- ගොවිතැනේ දී ගෙම්බා, සර්පයා, කවුඩා, කුරා අපට කරන උදව්වක් ලියන්න. (ලකුණු 10)

03. 1- සතුන් එක් ආහාරයක් මත යැපෙනවාට වඩා ආහාර වර්ග රාශියක් මත යැපේ. එය ඔවුන්ගේ පැවැත්මට බලපාන්නේ කෙසේද?

2- එක් ආහාරයක් මත යැපෙන දැනට වඳවීමේ තර්ජනයට භාජනය වී ඇති සත්වයෙකු නම් කරන්න.

3- සතුන් ශාක භක්ෂක වීමේ වැදගත්කම කුමක්ද?

4- මිනිසා විසින් සිදු කරන පරිසර හානිය ආහාර ජාල බිඳීයාමට හේතු වේ.උදාහරණ දෙකක් ලියන්න. (ලකුණු 10)

මතුගම අධ්‍යාපන කලාපය

විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

6 ශ්‍රේණිය	කාලගුණය හා දේශගුණය	ඒකකය - 11

(1) පහත දී ඇති ප්‍රකාශ නිවැරදි නම් "√" ලකුණද, වැරදි නම් " x " ලකුණද වරහන තුළ යොදන්න.

(i). අකුණු අනතුරු වළක්වා ගැනීම පිණිස අවශ්‍ය උපදෙස් ලබා දෙන්නේ ආකාශ වස්තු නිරීක්ෂණ ආයතනය මගිනි. ( )

(ii). වර්ෂාපතනය ප්‍රකාශ කිරීමට යොදා ගන්නා ඒකකය සෙන්ටි මීටර් වේ. ( )

(iii). කෙටි කාලයක් තුළ නියමිත ස්ථානයක පවතින වායුගෝලීය තත්වය දේශගුණය වේ. ( )

(iv). යම් ප්‍රදේශයක දේශගුණය පිළිබඳ අනාවැකි ප්‍රකාශ කිරීමට අවුරුදු 30 ක කාලගුණ දත්ත අවශ්‍ය වේ. ( )

(v). පරිසර උෂ්ණත්වය මැනීමට වෛද්‍ය උෂ්ණත්වමානය යොදාගනී. ( )

(vi). සුළං දිශා දර්ශකයේ හී තුඩ නැගෙනහිර දිශාවට යොමු වී ඇත්නම් සුළඟ හමන්නේ නැගෙනහිර සිට බටහිර දිශාවටය. ( )

(vii). ගංවතුර යනු ගොඩබිම් ප්‍රදේශයක් තාවකාලිකව ජලයෙන් යටවීමයි. ( )

viii). ආර්ද්‍රතාවය මනින උපකරණය අනිලමානයයි. ( )

(ix). සුළි සුළං හටගන්නේ වාතයේ ජල වාෂ්ප වැඩිවීම නිසාය. ( )

(x). ස්වාභාවික ආපදා සම්පූර්ණයෙන්ම වැළැක්වීමේ හැකියාව අපිට ඇත. ( )

ලකුණු 1 x 10 = 10

(2) පහත සඳහන් වචන වලින් සුදුසු වචනය තෝරා හිස්තැන් පුරවන්න.

(මධ්‍යසාර, සෙල්සියස්, මිලිමීටර්, වර්ෂාමානය, සුළංදිශා දර්ශකය, අඩු, වායුගෝලීය, වැඩි, අනිලමානය, රසදිය)

(i). වර්ෂාපතනය මනින්නේ .....මගිනි.

(ii). වර්ෂාපතනය මනින ඒකකය .....වේ.

(iii). .....අංශක මගින් උෂ්ණත්වය ප්‍රකාශ කළ හැකිය.

(iv). උෂ්ණත්වමානයක ඇති ද්‍රවය .....හෝ .....විය හැකිය.

(v). සුළඟේ වේගය මනින්නේ .....මගිනි.

(vi). සුළඟේ දිශාව මනින්නේ .....ආධාරයෙනි.

(vii). වියළි ප්‍රදේශයක වාතයේ ආර්ද්‍රතාව .....විය හැකි අතර, වර්ෂා සහිත දිනක වාතයේ ආර්ද්‍රතාව .....විය හැකිය.

ලකුණු - 10

(3) පහත A හි සඳහන් ප්‍රකාශ සඳහා ගැලපෙන පිළිතුර B කොටසින් තෝරා අදාළ අක්ෂරය වරහන තුළ ලියන්න.

A		B
(i). වායු පීඩනය අඩු වූ ස්ථානයක් මේ නමින් හඳුන්වයි.	( )	a. වැව්
(ii). ශ්‍රී ලංකාවට බලපාන සුළි සුළං හට ගන්නේමේ ප්‍රදේශය ආශ්‍රිතව ය.	( )	b. නියගය
(iii). සුළි සුළං සමග ඇතිවිය හැකි තවත් ආපදා තත්වයකි.	( )	c. නායයෑම්
(iv). ගොඩබිම් ප්‍රදේශයක් තාවකාලිකව ජලයෙන් යටවීම මෙසේ හැඳින්වේ.	( )	d. අකුණු
(v). යම් ප්‍රදේශයකට ලැබෙන වර්ෂාපතනය 75 % වඩා අඩු වූ විට හටගනී.	( )	e. කෝප්පය
(vi). ශ්‍රී ලංකාවේ වාර්ෂික වර්ෂාපතනය අඩුම කලාපය මෙම කලාපයයි.	( )	f. තෙත් කලාපය
(vii). නියගයට පිළියමක් ලෙස අතීත රජවරු නිර්මාණය කරන ලදී.	( )	g. පීඩන අවපාතය
(viii). ශ්‍රී ලංකාවේ වාර්ෂික වර්ෂාපතනය වැඩිම කලාපය යි.	( )	h. බෙංගාල බොක්ක
(ix). දින තුනක් පමණ තද වර්ෂාව පැවතීම නිසා ඇතිවන ස්වභාවික ආපදාවකි.	( )	i. ගංවතුර
(x). නිවසේදී සරල ආර්ද්‍රතාමානයක් සෑදීමට යොදාගත හැකි ද්‍රව්‍යයකි.	( )	j. ශුෂ්ක කලාපය

ලකුණු 1 x 10 = 10

(4) කාලගුණය හා දේශගුණය පාඩමේදී ඔබ විසින් සකස් කළ වර්ෂාමානයේ, සුළං දිශා දර්ශකයේ හා ආර්ද්‍රතාමානයේ රූප සටහන් ඉදිරිපත් කරන්න.

වර්ෂාමානය

ලකුණු - 3

සුළං දිශා දර්ශකය

ලකුණු - 3

ආර්ද්‍රතාමානය

ලකුණු - 4

ලකුණු - 10

(5) ශ්‍රී ලංකාවේ මහජනතාව වෙත නිකුත් කරන ලද කාලගුණ නිවේදනයක් පහත දැක්වේ.

" දිවයිනේ දකුණු හා බස්නාහිර ප්‍රදේශ වලට දිවා කාලයේ තද උණුසුමක් ඇතිවන අතර සවස් කාලයේ ගිගුරුම් සහිත තද වැසි ඇතිවිය හැකිය තද සුළං ද මේ සමග ඇතිවිය හැකිය. මුහුදු රළු වන අතර ධීවර ජනතාව ඒ පිළිබඳ ව සැලකිළිමත් විය යුතුය."

(i). කාලගුණ නිවේදනයක අඩංගු විය හැක ප්‍රධාන කාලගුණ සාධක 03 ක් සඳහන් කරන්න. ලකුණු-03

(ii). කාලගුණය යන්න කෙටියෙන් පහදන්න. ලකුණු-02

(iii). ආර්ද්‍රතාව යන්නෙන් කුමක් අදහස් වේ ද ? ලකුණු-02

(iv). කාලගුණ තත්වයන් නිවේදනය කරන රාජ්‍ය ආයතනය කුමක්ද ? ලකුණු-02

(v). කොළඹ, නුවර එළිය ,හම්බන්තොට යන ප්‍රදේශ අතරින් වාර්ෂික වර්ෂාපතනය අඩුම ප්‍රදේශය කුමක්ද? ලකුණු-01